අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
**Ministry of Education**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv.Level) Examination, 2024

සිංහල II
சிங்களம் II
Sinhala II

**71** **S** **II**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time-10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.**

උපදෙස්:

(i) **I** කොටසේ **1**ප්‍රශ්නය ද, **II** කොටසේ **2,3** ප්‍රශ්න ද, ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
(ii) **1** ප්‍රශ්නයේ ඇති **සියලු** ම අනුකොටස්වලට මේ **ප්‍රශ්න පත්‍රයේ** ම පිළිතුරු සපයන්න.
**(iii)** **I** කොටස, **II** කොටසේ පිළිතුරු පත් සමග **අමුණා භාර දෙන්න.**

## I කොටස

1. එක් එක් ප්‍රශ්නයට වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරා ගෙන, **එයට හිමි අංකය වරහන තුළ ලියන්න.**

1.1 **'ඥාන'** යන්නෙහි අන්තර්ගත අක්ෂර අයත් වන්නේ කවර වර්ගයකට ද?

(1) මූර්ධජ හා දන්තජ
(2) කණ්ඨජ හා තාලුජ
(3) තාලුජ හා මූර්ධජ
(4) තාලුජ හා දන්තජ
(5) දන්තෝෂ්ඨජ හා තාලුජ ය (.....)

1.2 නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පේළිය තෝරන්න.

(1) දෘෂ්ටිපතය, ප්‍රාශංගික, සංෂ්ලේශණය, කළ්‍යාණ, ආභාෂය
(2) දෘෂ්ඨිපථය, ප්‍රසාංගික, සංස්ලේසණය, කල්‍යාන, ආභාශය
(3) දෘෂ්ටිපථය, ප්‍රාසංගික, සංශ්ලේෂණය, කල්‍යාණ, ආභාසය
(4) දෘෂ්ටිපථය, ප්‍රාසාංගික, සංශ්ලේෂණය, කළ්‍යාණ, ආභාසය
(5) දෘෂ්ටිපතය, ප්‍රසාංගික, සංස්ලේෂනය, කල්‍යාන, ආභාෂය (.....)

1.3 අකාරාදි පිළිවෙළ අනුව නිවැරදි ව ලියා ඇති පද පේළිය තෝරන්න.

(1) කොළඹ, කෘත්‍රිම, කෞතුකාගාරය, ක්‍රියාවලිය, කුතුහලය
(2) පාසල, පින, ප්ලාවිත, ප්‍රකාශන, පංචායුධ
(3) ආගාධ, ආවේග, ආවේශ, ආලිංගන, ආංගික
(4) මිථ්‍යා, මෘදු, මොනරා, ම්ලේච්ඡ, මෞර්ය
(5) චංචල, චක්ෂුරින්ද්‍රිය, චතුෂ්ක, චපල, චරණ (.....)

1.4 පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) ප්‍රථමා හා ආලපන විභක්ති, විභක්ති සමාසයෙහි ලා නො ගැනේ.
(2) නාම ප්‍රකෘතියකට ප්‍රත්‍යයක් එකතු වීමෙන් කෘදන්ත නාම පද සෑදේ.
(3) ක්‍රියා මූලයකට ප්‍රත්‍යයක් යෙදීමෙන් සෑදෙන්නේ තද්ධිතයකි.
(4) සිංහලයේ නිපාත පද බොහෝ විට යෙදෙනුයේ වාක්‍ය ආරම්භයේ දී ය.
(5) සංඥා නාම සර්ව නාම යනුවෙන් ද හැඳින්වෙයි.

(.....)

1.5 එකිනෙකට අනුරූප වන සේ වචන යුගල යෙදී ඇති වරණය තෝරන්න.
(1) සූර්ය තාපය, මෘදු වදන්, සතුටු සාගරය, මාංස භක්ෂණය
(2) හෝරා යන්ත්‍රය, සුබ රාත්‍රියක්, මාර්ග සංඥා, රළු වචන
(3) අග්නි දාහය, පිවිසුම් මග, වෘක්ෂ දේවතාවා, සක්මන් මළුව
(4) ශක්‍ර දේවේන්ද්‍ර, අධ්‍යාපන ඇමති, ශ්වේත රාත්‍රිය, වෙළෙඳ භූමිය
(5) මං සලකුණු, බැති පූජා, වෙසක් උත්සවය, කොරියානු භාෂා (.....)

1.6 තත්සම පද පමණක් යෙදී ඇති වරණය කුමක් ද?

(1) කැම, නාම, ශ්‍යාම, ධූම
(2) බර, වර, සර, ධුර
(3) බාල, සේල, හීල, කාල
(4) සැප, දීප, රූප, කැප
(5) අෂ්ට, ඉෂ්ට, දුෂ්ට, පිෂ්ට (.....)

1.7 තද්භව වචන පමණක් අන්තර්ගත වරණය කුමක් ද?

(1) පුද, යුද, තෙද, නද
(2) ජල, දල, විල, බිල
(3) ගොනු, හනු, තනු, ධනු
(4) මල, කුල, තාල, මූල
(5) ලක, දුක, ශාක, සෝක (.....)

1.8 විභක්ති, විශේෂණ, අන්‍යාර්ථ සහ අව්‍යය යන සමාස පද අනුපිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

(1) ලියකොමල, බරනෙත, අනදර, සරාසඳ
(2) සරාසඳ, අනදර, ලියකොමල, බරනෙත
(3) බරනෙත, සරාසඳ, අනදර, ලියකොමල
(4) සරාසඳ, ලියකොමල, බරනෙත, අනදර
(5) බරනෙත, සරාසඳ, අනදර, ලියකොමල (.....)

1.9 කෘදන්තයක් නොවන පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) පැමිණිලි, සැලකිලි, ඇතිරිලි, ඇලපිලි
(2) පාදන, සාදන, වාදන, තර්ජන
(3) විද්‍යමාන, ශෝභමාන, ධරමාන, වර්තමාන
(4) ගැටුණු, නැමුණු, මිදුණු, බැඳුණු
(5) විදමන්, කියමන්, හිඟමන්, ලියමන් (.....)

1.10 පහත දැක්වෙන උද්ධෘතවල **තද කළු අකුරෙන්** මුද්‍රිත පද අයත් ක්‍රියා වර්ගය පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

(අ) "සිනා **සිසී** නැඟ එන්නා සූර්යා උදේ..."

(ආ) "කප් සුවහස් කල් පෙරුම් **පුරා** ගෙන..."

(ඉ) "**එන්න** මඳ නලේ..."

(ඊ) "දණ **ගාද්දී** ඇවිදින්නට මට අත දුන්න..."

(1) පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, විධි ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා
(2) අසම්භාව්‍ය ක්‍රියා, විධි ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා
(3) මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, පූර්ව ක්‍රියා, විධි ක්‍රියා
(4) විධි ක්‍රියා, පූර්ව ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, මිශ්‍ර ක්‍රියා
(5) මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, විධි ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා

(.....)

1.11 තද්ධිතයක් **නොවන** පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) සවනත්, ගගනත්, නුවනත්, මුහුණත්
(2) තාර්කික, වාර්ගික, කාර්මික, ධාර්මික
(3) පාපතර, එඩිතර, සුළුතර, අමතර
(4) කුශලතා, විරෝධතා, අවහිරතා, ප්‍රවීණතා
(5) කරටි, දිගටි, ඉහටි, තුනටි

(.....)

1.12 උපසර්ගයක් යෙදී **නැති** පදයක් සහිත පද පේළිය තෝරන්න.

(1) විමල, විරල, විකල, විචල
(2) පිළිතුරු, පිළිවෙළ, පිළිසඳර, පිළිසකර
(3) අභිමන්, අභිරහස්, අභිසෙස්, අභිදම්
(4) අනිසි, අගුණ, අගරු, අවිදි
(5) පිරිපුන්, පිරිපහදු, පිරිසිදු, පිරිනිවන්

(.....)

1.13 නිපාතයක් **නොවන** පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) හෙට, නිතර, සදා, ඉක්බිති
(2) වැළි, නැවත, පිළි, ආපිට
(3) තෙක්, දක්වා, තුරු, සිට
(4) පිණිස, පොබයා, අරබයා, උදෙසා
(5) ලෙස, බඳු, එව්, වන්

(.....)

1.14 "**පාඨශාලාන්තර** විවාද තරගයෙන් අප **විද්‍යාලයීය** ජ්‍යෙෂ්ඨ අංශයේ **ශිෂ්‍යශිෂ්‍යාවෝ** ප්‍රථම ස්ථානය ලැබූහ." යන වාක්‍යයෙහි වචන යෙදී ඇති පිළිවෙළ අනුව **තද කළු අකුරෙන්** දක්වා ඇති පද අයත් වන්නේ කුමන ව්‍යාකරණ අංගවලට ද?

(1) සන්ධි, තද්ධිත, සමාස
(2) සමාස, තද්ධිත, සන්ධි
(3) සන්ධි, සමාස, තද්ධිත
(4) තද්ධිත, සන්ධි, සමාස
(5) සමාස, සන්ධි, තද්ධිත (.....)

1.15 සමාන ව්‍යාකරණ ලක්ෂණ නිරූපණය කරන ක්‍රියා රූප සහිත වරණය තෝරන්න.

(1) කියව, බලව, දෙව, කියග
(2) ඇඹරෙමින්, දකිමින්, බලද්දී, වැටෙමින්
(3) කන්නේ ය, යන්නේ ය, බලන්නේ ය, හුන්නේ ය
(4) මැරී, බැලු, නැටු, දැරූ
(5) කියත, පනිත, සිටිත, දකිද්දී (.....)

1.16 සමාසයක් **නොවන** පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) නිකරුණේ, සුනිත්‍ය, අවිදු, අනවසර
(2) අනලස්, පාපහර, වරලස, ගම්වැසි
(3) මුදුපහස, කයීනජලය, තරුඅකුරු, දෙනුවර
(4) බලුකපුටු, හිරුසඳු, සගමොක්, තුරුලතා
(5) දසබල, පන්සිළු, සහසැස්, සියපත් (.....)

1.17 එක ම වර්ගයට අයත් **සන්ධි පද** පමණක් ඇතුළත් වරණය තෝරන්න.

(1) සිත්තරු, හග්ගල, පොල්ලත්ත, හිඟුරල
(2) තුම්මෝදර, කුකුළල, ගනදුර, සුරත
(3) රියැදුරු, වමැස, රත්මලාන, ඉන්නල
(4) හිතෝපදේශ, විද්‍යෝදය, ධනේශ්වර, අත්‍යුත්තම
(5) හග්ගෙඩිය, ලිග්ගල, වජ්පිහිය, රුප්පා

(.....)

1.18 ව්‍යාකරණානුකූල ව **නොගැළපෙන** වරණය තෝරන්න.

(1) කියන, ලියන, වියන, තියන
(2) අවනඩු, අවවාද, අවබෝධ, අවනම්බු
(3) ධීමත්, රූමත්, නාමත්, ශ්‍රීමත්
(4) මුහුදුදිය, වනමල්, මකුළුදැල, චර්මරෝග
(5) පිපිච්ච, වැටිච්ච, වෙච්ච, තෙමිච්ච (.....)

1.19 ව්‍යාකරණානුකූල ව නිරවද්‍ය වාක්‍යය තෝරන්න.

(1) ප්‍රේක්ෂකයන්ගෙන් නාට්‍ය ශාලාව පිරී ඉතිරී ගියහ.
(2) අවසන් වටයට තේරුණු නවක ගායකයා හෝ ගායිකාව ජයග්‍රහණය හිමි කර ගන්නී ය.
(3) ඔවුහු උත්සව ශාලාවට පැමිණ අසුන් ගති.
(4) සේවකයෝ වේලාසනින් ම පැමිණ ශුද්ධ පවිත්‍ර කටයුතු නිමා කොට ඇත.
(5) නායකයන් ආදර්ශවත් වෙත් ද පොදු ජනයා ද ඒ මග යනු ඇත. (.....)

1.20 ලේඛන ව්‍යවහාරයට වඩාත් සුදුසු වාක්‍යය සහිත වරණය තෝරන්න.

(1) කලින් ආවත් ඇයට කාර්යාල දුම්රිය අල්ලන්න බැරි විය.
(2) කටින් කට යන බොරු ආරංචි ගණන් ගත යුතු නැත.
(3) ඔහු හෙමින් සැරේ ඇවිත් මගේ පිටට තට්ටුවක් දැම්මේ ය.
(4) දිවා රෑ නොතකා වැඩ කිරීමෙන් ජයග්‍රහණය ලද හැකි ය.
(5) වෙන්න තියෙන දේ වැළැක්විය නොහැකි යැයි බොහෝ දෙනා සිතති. (.....)

**

3082

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தரப் பரீட்சை, 2024
General Certificate of Education (Adv. Level) Examination, 2024

| | |
|---|---|
| සිංහල I<br>சிங்களம் I<br>Sinhala I | 71 S I |

| | |
|---|---|
| පැය තුන යි<br>மூன்று மணித்தியாலம்<br>Three hours | අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි<br>மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்<br>Additional Reading Time - 10 minutes |

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

**උපදෙස්:**

* **පළමු** ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

**1.** පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) හා (උ) උද්ධෘත අතුරෙන් **සතරක්** තෝරා ගෙන ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට ද (ඌ) හා (එ) ප්‍රශ්නවලට ද පිළිතුරු සපයන්න. (මේ ප්‍රශ්නයට පිළිතුරු ලිවීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදා ගන්න.)

(අ) ඒ අසා බමුණානෝ පුතණුවන් මියා ම තමා අඳනා පිලවත් දුවා සේ 'ළදරුවාණෙනි, තොපි ඉල්වනා සක්සාළු මාගේ සම්පත් බොහෝ ට ඇති බැවින් රන්රිදීන් දුවත් රිදියෙන් දුවත් මුතුමැණිකින් ආදියෙන් දුවත් තොප කියාලූ තරමෙක කරවා දෙමි. දුවමනා තරමක් කියව' යි මත් පමණකින් හා යම්තම් පිලයකින් කරවා දිලිය නොහී කුණ්ඩලාභරණය තුබූ බ තොට දුන් හැකාත්තෝ 'සක්රුවනින් සක්සාළුක් කරවා දෙමි' යි කීහුය. ඒ අසා මට්ටකුණ්ඩලී දෙව්පුත් 'මේ තමාගේ පුතුට මෙතෙක් පමණක් දුවමනා දෙය නොකරවා හැත් වත්නළු මනා ගසට නුඹපැත් වත්කරන්නා සේ නොමරණදේ මෙතෙක් තොට මරා තබාලා දුන් පුතණුවන් හැටියේ ආ මා සී දෙයක් කරවා දෙමි කියයි. කරයේ ම නූ වනිත කරවා ලුම්. තොපා විසර සක්සාළුක් කරවා දෙඩු දු යි වියාළහ. 'තොපා කී විනොරකු' යි කී කල්හි. 'මාගේ රථමැදිරිය නොරන්මුවා ය. එසේ හෙයින් ඊට තරම් වනොත් හිර හා සඳ ය. ඒ දෙක සම්න වී නම් ගෙනේ බලාලූ කල්ට ජම්බාංග ජාතකයෙහි හංසරාජ ව උපන් බෝසතුන් කිසිවියට පලුම්වත් සෙත්සපූන්ට පලුමැන්ම්ත් නැති හෙයින් ඉතා බැලුක. එසේ හෙයින් හිර හා සඳ සම්ත වී නම් ඒ මාගේ රථය ගොහිමි. තොපු **සක්වලින්** ප්‍රයෝජන නැතැ' යි කීය.

(i) බමුණා, තම පුතුට මෙතෙක් කළ ආකාරය නිරූපණය කෙරෙන උපමාව කුමක් ද?
(ii) මට්ටකුණ්ඩලී දිව්‍ය පුත්‍රයා තමාගේ රථයට ගැළපෙතැයි කී චක්‍ර යුගලය කුමක් ද?
(iii) "නොමරණදේ මෙතෙක් තොට මරා තබාලා" යන පිබිල් බසින් ලියන්න.
(iv) '**සක්වලින්**' යන්නට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 04 යි.)

(ආ) එවේලෙහි ජීවකයෝ සිවාණන් ඇඳෙදන උඩු මලා වැදගොඩා සියලඟ නොහැලෙන සේ ඇඳ හා එක් කොට පටබිළියෙන් වෙලා සිවාණන් ඉස්ගෙදර වැදහිඳ පුස්සම වූ හැතත් ගෙන සිවාණන් ඉස්මොල්ල පළා තුන් සන්ධිය මෙන් කොට ඉස්මුල් කන පණුවන් දෙදෙනා හැණ්ඩුවෙන් ගෙන එළියේ දුන. එළියේ ලා 'මේ පන්දුවකින් කා මරන පණුය. මේ පන්දුවකින් කා මරන පණුය' යි කියා පෑහ. ඒ විස්ම දුටු මහාපිරිස වහවිට ම කවුතුකට දුන්හ. එවේලෙහි ජීවකයෝ සිවාණන් හිස්මොල්ල පෙර සේ ම සකී කොට ලොම්කුත් අඩුවැඩි නොපෙනෙන නම් **බැහැලී ගෙන** ඉසට ගල්වා සිවාණන් සත්දවසක් එක් ඇලයකින් සතපා දකුණු ඇලයෙන් සත්දවසක් සතපා වම් ඇලයෙන් සත්දවසක් සතපා පෙර එක් විසිමසකට තියම කරවාගත් පිළියම් එක්විසිදවසින් ගොඩනගා සිවාණන් හිස්මුල් අටෙන්ට හැඩි නැත නොපෙනෙන සේ වණය සුව කළහ.

(i) ඉස්මුල් කන පණුවන් ඉවත් කිරීම සඳහා ජීවකයන් සිදු කළ ආකාරය කෙබඳු ද?
(ii) ජීවකයන් පසු වණය සුව වීමට ගත වූ කාලය කොපමණ ද?
(iii) "සිවාණන් හිස්මුල් අටෙන්ට හැඩි නැත නොපෙනෙන සේ වණය සුව කළහ" යන පිබිල් බසින් ලියන්න.
(iv) '**බැහැලී ගෙන**' යන්නට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 04 යි.)

[පිටුව බලන්න]

(ඉ) "සොඳුර තොප ඉණ තුඹු ඉණකඩින් තොප පලන් ආභරණ ගලවා බැඳ දී ලන්න. එතර සිට අවුත් තොප කැඳවා ගෙන යෙමි" කියන්නා "යහපතැ" යි ඒ කියාවට තමා ඉණ සිඹු ඉණ කඩෙහි තමා **පලන්** ආභරණ ගලවා බැඳ දී ලන්නා සොර දෙටු ඇරගෙන ගඟින් එතර පීනා ගොස් යන්ට ආකාර දක්වාලී ය. ස්ත්‍රිය කියන්නී "ඇයි ස්වාමි පුත්‍රයාණෙනි, මා ඇර පියා නික්මුණු නියා දැ?" යි කියන්නී "තොපගේ පරණ සැමියන්ට කළ ගුණ දුටු කල මට තමා ම වේ ද? තිගෙන් මට ප්‍රයෝජන නැතැ" යි කියා නික්මුණෙහ. ස්ත්‍රී ගඟ සමීපයේ ඇඬෑ උන්නී ය. ශක්‍රයෝ මෙපවත් දැන පඤ්චසිඛයා හා මාතලී දිව්‍ය පුත්‍රයා කැඳවා කියන්නාහු "අසවල් ගඟ සමීපයේ උන් ස්ත්‍රී වෙහෙසන්ට උව මැනවැ" යි කියා පඤ්චසිඛයා උකුසු වෙසක් හා මාතලී දිව්‍ය පුත්‍රයා මත්ස්‍ය වෙසක් හා ශක්‍රයෝ තුමූ කැණහිල් වෙසක් මවාගෙන කටින් දව මස් කැටියක් වැ ගෙන...

(i) මෙම ඡේදයෙහි සඳහන් පරිදි සොර දෙටුවා ස්ත්‍රිය අත හැර යෑමට හේතු වූ කාරණය කුමක් ද?

(ii) ස්ත්‍රිය වෙහෙසට පත් කිරීම සඳහා ශක්‍රයා තව කී දෙනකු කැඳවූයේ ද?

(iii) "තොප ඉණ තුඹු ඉණකඩින් තොප පලන් ආභරණ ගලවා බැඳ දී ලන්න" මෙය ලිහිල් බසින් ලියන්න.

(iv) '**පලන්**' යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි.)

(ඊ) මෙසේ උද්දාලබ්‍රාහ්මණයා විසින් කියන්නාවූ ඒ වචනය අසා ඔහුගේ මිත්‍ර ජනයෝ එක් ව කියන්නාහු "එම්බා ආචාර්යනි, තෙපි දැන් යම් ස්ත්‍රියක් ප්‍රාර්ථනා කරා නම් මිනොමෝ උත්තම ජාතීන් විසින් සංවාසයක් නොකට යුත්තා වූ චණ්ඩාල කෙල්ලක් මය; කිමෙක් ද ආචාර්යනි, අතා ළං විය නොහැකි දුගඳ පිළිකුල් වූ අපවිත්‍ර ශරීරයක හා මනෝඥ වූ සුවඳ විහිදුනා සිහිල් සඳුන් හා දෙක කවර කලෙක නෙසේ නම් එක් වේ ද? සතිහා නොවන හෙයින් එක් නොවන්නේ මය; එබැවින් සිසි කලෙකත් එක් නුව මනා හීනජාතීන් හා සංවාසය කරන්නාවූ උත්තම සත්වයාගේ ශ්‍රී කාන්තාවය කීර්තිය ආයුෂය ශරීරබලය ඉවණය යන මෙකී සියල්ල ම ඔහු අන්තැර දුරු ව පලා යන්නේය; එහෙම කෙළවර බොහෝ **අයශේ** අසා නින්දාවට පැමිණෙන්නේ" යි කීහ.

(i) මෙම ඡේදයෙහි දැක්වෙන පරිදි කවර කලෙක වත් එක් නො වන්නා වූ වස්තු **දෙක** කවරේ ද?

(ii) උත්තම සත්ත්වයා වෙතින් පලා යන කරුණු කීයක් මෙහි සටහන් වේ ද?

(iii) "මිනොමෝ උත්තම ජාතීන් විසින් සංවාසයක් නොකට යුත්තා වූ චණ්ඩාල කෙල්ලක් මය" මෙය ලිහිල් බසින් ලියන්න.

(iv) '**අයශේ**' යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි.)

(උ)

නැත පිවි රස් සහ ස
නොපිපෙන තඹුරු වන ලෙ ස
ඔහු වෙණ නදින් මී ස
අනික් නදකින් අපි නොවෙමු තොස ස

**දමන** මුල් අඳු රු
ලවන ලොබ ලිය සඳු රු
එවෙණ නද මීහු රු
සවන නොකරන කෙනෙක් කවු රු

(i) 'ලොබ ලිය' යන්න කවර අලංකාරයකට අයත් වේ ද?

(ii) දෙ වන පදයෙහි 'වීණා නාදයෙහි මිහිරි බව' දැක්වීමට කරුණු කීයක් දක්වා තිබේ ද?

(iii) "නොපිපෙන තඹුරු වන ලෙස" මෙය ලිහිල් බසින් ලියන්න.

(iv) '**දමන**' යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි.)

- (ආ) සහ (ඇ) ප්‍රශ්න **දෙකට ම** පිළිතුරු සපයන්න.

(ආ) පහත සඳහන් උද්ධෘත ඇසුරෙන් **සතරක** අවස්ථා සම්බන්ධය දක්වන්න.

(i) "තොප මට සිනාසෙන්ට කාරණා කිම ද?"

(ii) "සමහර කලෙක ජරාව පළමුව යෙයි. සමහර කලෙක ජරාවට මරණ පළමුව යෙයි."

(iii) "කවර දවසෙක අවුත් කොයිදී මා හා කථා කළේ දැයි?"

(iv) "මරණ නම් අදය සෙටය යි දැනගත නොහැක්ක; ඒ නියමයෙක් නැත."

(v) "අනේ, අප්පොච්චියෙ, එච්චර ම යි අපි ළඟ තියෙන්නෙ. අපි බොහොම අසරණ මිනිස්සු."

(vi) "ඉබ්බ දියට දමන කොට ඇත්තැවෙ කියයි යන කියමන මට සිහි විය."

(vii) "යොවනයේ සුවඳ මල් ද
යොවනයේ මිහිරි පල ද
සරසවියගෙ පුදසුන මත
මැලවී ඇත තුබු අයුරු."

(ලකුණු 03 × 4 = 12 යි.)

(ඇ) වස්තු විෂය හා කාව්‍ය භාෂාව කෙරෙහි අවධානය යොමු කරමින් පහත සඳහන් පද්‍ය පන්තිය පිළිබඳ රසවින්දනයක් කරන්න.

**සමනොලයෙකුට**

තුඹතල ළහිරු බබළයි උණුසුම් ය — පවන්
සිලුතැල උරයි වන මල් රොන් රසය — තවත්
එහිලොල නොවී පියඹා ආ ගමන — මෙවන්
සමනොල මිතුර තුඹට යි මගෙ — ආයුබෝවන්

ද ඔ රන් සුමණන් පෙති සිරියල් — කලාවක
සුබ සිරි හඳුන්වා සුපුරුදු — වෙලාවක
සිඹ සිඹ කුඩා ගස් වන මල් බලා — ගොස
තුඹ ආ ගමන සිහද — ගයනාවෙක

ගණනිල් තණග පිනි ටික ටික — මැකෙද්දී
සුවිසල් අරුණු දද පොරබද — දිලෙද්දී
රොනමුල් සුළං රැළි දකුණෙන් — වැනෙද්දී
සිරියල් සිතෙන වී ද තුඹ සිරු — කැලෙද්දී

ජේන්වල සුවන් වට පිට — මලද්දී
රං කුරුල්ලන් තුති ගී — කියද්දී
පාන්දර පීන් පිරිකඩ — වැටෙද්දී
ජෝන්, හඳුනාන්ට බැහැ මල් — පිපෙද්දී

තම තුනු කැලුම් සිලිලෙන් නැහැවෙවී — වසන්
මල් පාරමක ගතියෙන් නැළවෙවී — වසන්
කවුරුත් තුඹට ආදරයයි, එදැන — වසන්
සමනොල පුණ්‍යරාගය මා ළඟට — වසන්

(ලකුණු 12 යි.)

2. (අ) "සද්ධර්මරත්නාවලී [illegible]" [illegible]

**[illegible]**

(ආ) "[illegible]" [illegible]

(ලකුණු 15 යි.)

3\. (අ) සමාජයෙන් පැන නගින විවිධ අභියෝගවලට කාන්තාව මුහුණ දෙන ආකාරය නිරූපණය කිරීමෙහි ලා සද්ධර්මාලංකාර කතුවරයා දක්වන සාමර්ථ්‍යය නිර්දිෂ්ට කථා ඇසුරෙන් විමසන්න.

**නැත හොත්**

(ආ) පූජාවලී කර්තෘවරයා අප්‍රධාන චරිත රාශියක් උපකාරී කොට ගැනීමෙන් ප්‍රධාන චරිතය ඉස්මතු කොට දැක්වීමේ ශිල්පීය උපක්‍රමය භාවිත කොට ඇති ආකාරය නිර්දිෂ්ට කථා ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 15 යි.)

4\. (අ) කෝට්ටේ අවධියෙහි සිංහල පද්‍ය කාව්‍යයේ උන්නතියට තුඩු දුන් තත්කාලීන සමාජ-සංස්කෘතික පසුබිම කරුණු **තුනක්** ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 07 යි.)

(ආ) "සිද්ධි තෝරා ගැනීමෙන් ඊට අනුගත චරිත ක්‍රියාත්මක වන ආකාරය මනා ලෙස දැක්වීමෙන් නිසා ගුත්තිල කාව්‍යයේ කථා ශරීරය අර්ථවත් වී තිබේ" තෝරා ගත් සිදුවීම් **තුනක්** ඇසුරෙන් උක්ත කාරණය විමර්ශනය කරන්න. (ලකුණු 08 යි.)

5\. "ලෙනාඩ් වුල්ෆ්ගේ වෑයම වූයේ, යටත් විජිත පාලනයේ පැවති යථාර්ථය හඳුනා ගැනීමත් එය කලාත්මක ව නිරූපණය කිරීමත් ය." බැද්දේගම නවකතාව ඇසුරෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 15 යි.)

6\. කෙටිකතාවක "ජීවන දෘෂ්ටිය" යනු කුමක් දැයි පැහැදිලි කොට, එය ඇරැව්වල නන්දිමිත්‍රගේ 'තෑගී' කෙටිකතාවේ පිළිබිඹු වන ආකාරය පරීක්ෂා කරන්න. (ලකුණු 15 යි.)

7\. වර්තමාන සමාජ ක්‍රමය තුළ මාපිය-දූදරු අන්තර් සම්බන්ධතාවල පැවැත්මත්, ඒවා බිඳ වැටීමත් පිළිබඳ වේදනාවක් නිරූපිත ආකාරය නිර්දිෂ්ට පද්‍ය රචනා **තුනක්** ඇසුරෙන් විමසන්න. (ලකුණු 15 යි.)

8\. "ආචාර්ය-ශිෂ්‍ය දෙපාර්ශ්වයේ ම වූ අභිමතාර්ථ සපුරා ගැනීමට දරන උත්සාහය නිමාවට පත්වන්නේ මහත් වූ ව්‍යසනයකිනි." පෙම්තො ජායති සොකො නාට්‍යය ඇසුරෙන් සනිදර්ශන ව පහදන්න. (ලකුණු 15 යි.)

***